**2021 හා 2022 අ.පො.ස. (උසස් පෙළ) ප්‍රතිඵල මත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ශික්ෂණලාභීන් ඇතුළත් කර ගැනීමේ සම්මුඛ පරීක්ෂණය - 2023 (2024)**

| පාඨමාලා අංකය | පාඨමාලාව | මාධ්‍යය |
|---|---|---|
| 06 | ගණිතය | සිංහල |
| 08 | ගණිතය | ඉංග්‍රීසි |

2021 හෝ 2022 වර්ෂයේ අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල මත තුන් අවුරුදු පූර්වසේවා ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීම සඳහා ශික්ෂණලාභීන් කණ්ඩායම් 02 ක් එකවර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත් කර ගැනීම 2023 (2024) මැයෙන් 2024.03.15 දිනැති රජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද ගැසට් නිවේදනය ප්‍රකාරව ඔබ විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රය අනුව උක්ත පාඨමාලාව සඳහා සුදුසුකම් පරීක්ෂා කර බැලීමේ සම්මුඛ පරීක්ෂණය පහත සඳහන් පරිදි පැවැත් වේ.

**ස්ථානය-නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, විල්පිට , අකුරැස්ස.**

(ඔබට සම්මුඛ පරීක්ෂණය සඳහා නියමිත දිනය, වේලාව සහ සම්මුඛ පරීක්ෂණ මණ්ඩල පිළිබඳ තොරතුරු මේ සමඟ යොමු කරන ලේඛනයෙහි දක්වා ඇත.)

## පොදු උපදෙස්

**මෙම උපදෙස් ප්‍රකාරව සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් විය යුතුය.**

**01. ඇමුණුම 01 සිට 06 දක්වා සියළු පත්‍රිකාවල Print outs ලබා ගත යුතුය.**

**02. ඇමුණුම 01 හි** සඳහන් ජන්ද හිමි නාමලේඛන තොරතුරු සම්පූර්ණ කර ඔබට නියමිත මැතිවරණ උද්ධෘත පරීක්ෂා කිරීමේ මණ්ඩලය වෙත ලබාදිය යුතුය.

**03. ඇමුණුම් 02 හි** සඳහන් මැතිවරණ උද්ධෘත පරීක්ෂා කිරීමේ තොරතුරු පත්‍රිකාවේ 1 - 7 දක්වා වූ තොරතුරු පමණක් සම්පූර්ණ කර මැතිවරණ සඳහා පරීක්ෂා කිරීමේ මණ්ඩලය වෙත ලබා දිය යුතුය.

**04. ඇමුණුම 03 හි** අ- කොටස සහ ආ - කොටස සම්පූර්ණ කර ඔබට නියමිත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට භාර දිය යුතුය.

**05. ඇමුණුම 04 හි** සඳහන් පත්‍රිකාවේ 1 - 8 දක්වා වූ තොරතුරු පමණක් සම්පූර්ණ කර කාඩ්බෝඩ් ලිපි කවරයක ( File ) ඉදිරිපස අලවා ඔබට නියමිත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට භාර දිය යුතුය. මෙය ගණිතය සිංහල මාධ්‍යය සිසුන් නිල් පැහැති පාට A4 කොලයක සහ ගණිතය ඉංග්‍රීසි මාධ්‍යය සිසුන් කහ පැහැති A4 කොලයක මුද්‍රණය කළ යුතුය. එසේම **ඇමුණුම 03 හි** ආ - කොටස සඳහන් වන <u>පිළිවෙලට</u> ඔබ විසින් ම සහතික කරන ලද සහතික පත්වල ජායා පිටපත් හා ජීව දත්ත පත්‍රිකාවේ සහ දිවුරුම් ප්‍රකාශවල මුල් පිටපත් එම ලිපි කවරයකට ඇතුළත් කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට භාර දිය යුතුය.

**06. ඇමුණුම 05 සහ 06 හි** සඳහන් දිවුරුම් ප්‍රකාශ ,ජීව දත්ත පත්‍රිකාව සම්පූර්ණ කර එහි මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට භාර දිය යුතුය .එසේම ඔබ මෙම සම්මුඛ පරීක්ෂණයට සහභාගි <u>නොවන්නේ නම්</u> ඇමුණුම 7 සඳහන් පරිදි ඒ පිළිබඳව දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

**06. සියලුම සහතිකපත්වල මුල් පිටපත් වෙනම ලිපි ගොනුවක රැගෙන ආ යුතුය.**

# සම්මුඛ පරීක්ෂණය සඳහා පොදු උපදෙස්

01. පහත දැක්වෙන සියලුම සහතිකවල මුල් පිටපත් හා එම සහතිකවල සහතික කළ ඡායා පිටපත් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කළ යුතු වේ.

I. සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ ලිපිය( සම්මුඛ පරීක්ෂණ දින ලබාදෙනු ලැබේ.)

II. උප්පැන්න සහතිකය (රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් "නොමිලයේ නිකුත් කරන ලදී" ලෙස සටහන් කර නිකුත් කළ මුල් පිටපතින් උපුටා ගත් සටහන භාර ගනු නොලැබේ.)

III. ජාතික හැඳුනුම්පත

IV. අධ්‍යාපන සහතික (මෙම ඇමුණුමෙහි අංක 02 යටතේ දක්වා ඇති සහතික මේ සඳහා අදාළ වේ.)

V. ස්ථිර පදිංචිය නිර්ණය කිරීම සඳහා 2024.03.15 දිනැති ගැසට් නිවේදනය ප්‍රකාරව පහත සඳහන් ලේඛන **පමණක්**, ඔබට ඇති අදාළත්වය අනුව ඉදිරිපත් කළ යුතු වේ.

- අදාළ වසර තුනෙන් වසර එකක් හෝ දෙකක් පමණක් ඡන්දය සඳහා ලියාපදිංචි වී ඇත්නම්, ඉතිරි වසර එක / දෙක සඳහා ස්ථිර පදිංචිය සනාථ කිරීම පිණිස පිළිගත හැකි වෙනත් ලේඛන
(උදා - අදාළ ස්ථිර පදිංචිය සහිත ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචිය හා චරිතය පිළිබඳ සහතිකය (DS-04), පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත ආදිය)

- ඔබ අදාළ කාලසීමාව තුළ දෙමාපියන් හැර වෙනත් භාරකරුවකු යටතේ ස්ථිරව පදිංචිව සිටී නම්, එම භාරකාරත්වය කාලසීමාව ද සහිතව අදාළ ග්‍රාමසේවක විසින් නිකුත් කරනු ලබන පදිංචිය හා චරිතය පිළිබඳ සහතිකයේ (DS-04) – 'වෙනත් කරුණු' තීරය යටතේ සඳහන් කර සනාථ කළ යුතුය.

- යම් හෙයකින් නියමිත වසර තුනට හෝ ඉන් කිහිපයකට ඡන්දහිමි නාම ලේඛන හරහා පදිංචිය සනාථ කිරීමට නොහැකි අවස්ථාවලදී ඡන්දය ලියාපදිංචි කිරීමට නොහැකි වීම පිළිබඳව පිළිගත හැකි හේතු, ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන පදිංචිය හා චරිතය පිළිබඳ සහතිකයේ (DS-04) 'වෙනත් කරුණු' තීරය යටතේ අදාළ ස්ථිර පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී ගේ අත්සනින් සනාථ කළ යුතුය.

❖ **සැලකිය යුතුයි.**

- ස්ථිර පදිංචිය නිර්ණය කිරීමට අදාළ තොරතුරු ඡන්දහිමි නාම ලේඛන සම්බන්ධ පරිගණකගත දත්ත ආශ්‍රයෙන් පරීක්ෂා කරන බැවින්, මැතිවරණ කාර්යාල හරහා ඡන්දහිමි නාම ලේඛනවල සහතික කළ උපුටන ලබා ගැනීම අවශ්‍ය නොවේ.

- ඔබ විසින් සම්මුඛ පරීක්ෂණයට රැගෙන එන පදිංචිය හා චරිතය පිළිබඳ සහතිකයේ ම (DS-04) ඉහත සඳහන් තොරතුරු ද සඳහන් කළ හැකි වේ.

02. විභාගයට පෙනී සිටි සෑම වාරයක් සඳහාම පහත සඳහන් පරිදි අධ්‍යාපන සහතික, විදුහල්පති / පරිවේණාධිපති / විභාග කොමසාරිස් ජනරාල් නිකුත් කළ සහතිකවල මුල් පිටපත හා එහි සහතික කළ ඡායා පිටපතක් බැගින් වන සේ ඉදිරිපත් කළ යුතුය.

I. අ.පො.ස.(උ.පෙළ) ප්‍රතිඵල සහතිකය (අදාළ විදුහලෙන් මෙම සහතිකය ලබා ගැනීමේ දී විභාගයට පෙනී සිටියේ කී වෙනි වතාවට ද යන්න සඳහන් කර, එය විදුහල්පති විසින් ද සහතික කර තිබිය යුතුය.)
II. අ.පො.ස.(උ.පෙළ) විභාගයේ Z අගය සඳහන් ප්‍රතිඵල සහතිකය
III. අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සහතිකය / මූලික පිරිවෙන් අවසාන විභාගයේ ප්‍රතිඵල සහතිකය
IV. විශේෂ සුදුසුකම් සනාථ කරන අනෙකුත් සහතික (සැ.යු. - සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වන පාඨමාලාවට අදාළව ගැසට් නිවේදනයේ දක්වා ඇති විශේෂ සුදුසුකම් සනාථ කරන සහතික මේ සඳහා අදාළ වේ.)

03. වෙනත් සහතික හා ලේඛන

I. අවසන් වරට ඉගෙනුම ලැබූ විදුහලේ විදුහල්පතිතුමාගෙන් / තුමියගෙන් ලබාගත් චරිත සහතිකය
II. ග්‍රාම නිලධාරීගෙන් මාස 06 ක් ඇතුළත ලබා ගත් පදිංචිය හා චරිතය පිළිබඳ සහතිකය (DS-04)
III. පාසල් හැරයාමේ සහතිකය (ශිෂ්‍ය කාර්ය දර්ශකය)
IV. පාඨමාලාවට අදාළ ප්‍රවීණතා සනාථ කරන සහතිකය
V. ගැසට් නිවේදනයේ 9.7 වගන්තිය ප්‍රකාරව අ.පො.ස.(උ/පෙළ) ප්‍රතිඵල මත බඳවා ගෙන 'රජයේ නිදහස් අධ්‍යාපන වරප්‍රසාද' යටතේ ක්‍රියාත්මක රජයේ උසස් අධ්‍යාපන ආයතනයක වෘත්තීය පුහුණු පාඨමාලාවකට / ඩිප්ලෝමා පාඨමාලාවකට හෝ උසස් ඩිප්ලෝමා පාඨමාලාවකට අභ්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි වී සිටී නම් ඊට අදාළ ලේඛන

VI. තමන් විසින් මාර්ගගත ක්‍රමවේදය (Online System) හරහා යොමු කරන ලද අයදුම්පතෙ හි ස්ථිර දෘඪ පිටපත (PDF)

**සැලකිය යුතුයි :-**

අයදුම් කරන අවස්ථාවේ දී ඒවායේ සංශෝධන සිදු කරන අවස්ථාවේ දී මතු වූ විවිධ තාක්ෂණික ගැටළු හේතුවෙන් ස්ථිර දෘඪ පිටපත (PDF) ලබා ගැනීමට නොහැකි වූ අයදුම්කරුවන්ට එම පිටපත නොමැතිව සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම කිසිදු ගැටළුවක් නොවේ. එබැවින් තමන් සතුව එම පිටපත නොමැති වීම පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයෙන් / ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලින් විමසීම් නොකළ යුතු බව අවධාරණය කරනු ලැබේ.

04. අයදුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු ප්‍රකාශ පත්‍රය

I. ජීව දත්ත ප්‍රකාශය

II. අවිවාහක බවට ප්‍රකාශය (විද්‍යාපීඨ ප්‍රවේශය සඳහා අයදුම් කරන විට / සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින විට විවාහය ලියාපදිංචි කර නොමැති බවට / දික්කසාද වී නොමැති බවට වන ප්‍රකාශය)

III. රජයේ හෝ රජයේ ආධාර ලබා උපකෘත පාසල්වල, රජයේ ලියාපදිංචි පිරිවෙන්වල හෝ අනුමත වෙනත් විද්‍යායතනවල ගුරුපත්වීමක් ලබා නොමැති හෝ තෝරාගෙන නොමැති බවට වන ප්‍රකාශය

IV. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක පාඨමාලාවක් හදාරමින් සිට හැර ගොස් නොමැති බව, හදාරමින් නොසිටින බව, හදාරා අවසන් කර ඇති බව, විනයානුකූල හේතූන් මත හෝ වෙනත් හේතූන් මත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයකින් ශිෂ්‍යභාවය අවලංගු කර නොමැති බවට වන ප්‍රකාශය

V. රජයේ විශ්වවිද්‍යාලයක / රජයේ විශ්වවිද්‍යාල විද්‍යායතනයක අ.පො.ස.(උ.පෙළ) සුදුසුකම් වලින් බඳවා ගනු ලබන උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා "රජයේ නිදහස් අධ්‍යාපන වරප්‍රසාද" යටතේ අභ්‍යන්තර ශිෂ්‍යයකු ලෙස ලියාපදිංචි වී නොමැති බවත්, එවැනි පාඨමාලාවක් හදාරමින් නොසිටින බවත්, එවැනි උපාධි පාඨමාලාවක් හදාරා අවසන් කර නොමැති බවත්, අදාළ පාඨමාලාවක ලියාපදිංචි වී සිට ගැසට් නිවේදනය පළවීමෙන් පසුව ලියාපදිංචිය අවලංගු කරගෙන හෝ ගැසට් නිවේදනය පළවීමෙන් පසුව / සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමෙන් පසුව ඉහත ආයතනයක අදාළ පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී පසුව එය අවලංගු කරගෙන නොමැති බවටත් වන ප්‍රකාශය

ඉහත සඳහන් ප්‍රකාශ පත්‍ර නිවැරදිව සම්පූර්ණ කර සාමදාන විනිශ්චයකාරවරයකු ( **මුළු දිවයිනටම** ) ලවා සහතික කර රැගෙන ආ යුතු වේ.

05. සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කළ යුතු සහතික, නිසි පරිදි සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍ර හා ප්‍රකාශ පත්‍ර සම්මුඛ පරීක්ෂණ දිනයේදී ම ඉදිරිපත් කිරීම අනිවාර්යය වන අතර, එසේ කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් ගැසට් නිවේදනයේ 7.2 වගන්තිය ප්‍රකාරව තෝරා ගැනීම් වලදී සලකා බලනු නොලැබේ.

06. ඔබ විසින් සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබන සියලුම සහතික හා සෙසු ලේඛන පිළිබඳ ලැයිස්තුවක් ඔබගේ අත් අකුරින්ම ලියා එය සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ බවට සහතික කර සම්මුඛ පරීක්ෂණය අවසානයේ දී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත භාර දිය යුතු වේ.

07. උප්පැන්න සහතිකයේ සඳහන් නම නමෙහි හෝ / හා සහතිකවල සඳහන් නමෙහි යම් වෙනසක් තිබේ නම් ඒ බව දිවුරුම් ප්‍රකාශයක් මඟින් සනාථ කළ යුතුය.

08. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන සියලුම ලේඛනවල ඡායා පිටපත්වල පහතින් ඔබේ අත් අකුරින් "මෙම සහතිකය මුල් පිටපතේ සත්‍ය පිටපතක් බව සහතික කරමි" යනුවෙන් පැහැදිලිව ලියා ඔබ විසින්ම සහතික කර තිබිය යුතු අතර මුල් පිටපත් හා සහතිකපත්වල ඡායා පිටපත් වෙන වෙනම ගොනු දෙකක් ලෙස සකස් කර ගෙන සම්මුඛ පරීක්ෂණයට රැගෙන ආ යුතුය.

09. ඔබ නියමිත දින නියමිත වේලාවට ගුරු වෘත්තියට ගැලපෙන ඇඳුමකින් සැරසී සම්මුඛ පරීක්ෂණයට අනිවාර්යයෙන්ම සහභාගී විය යුතුය. පිළගත හැකි සාධාරණ හේතුවක් මත නියමිත දින සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීමට හැකියාවක් නොමැති නම්, ඒ පිළිබඳ අදාළ අධ්‍යාපන විද්‍යාපීඨය වෙත විද්‍යුත් පණිවිඩයක් මඟින් නොපමාව දැනුම් දීම අනිවාර්ය වේ. (ඊට අමතරව දුරකථන ඇමතුමක් ද ලබා දීම වඩාත් යෝග්‍ය වේ.) නියමිත දින පූර්ව දැනුම් දීමකින් තොරව සම්මුඛ පරීක්ෂණයට සහභාගී නො වුවහොත් එම අයදුම්කරු වෙනුවට අදාළ දිස්ත්‍රික්කයේ කුසලතා අනුපිළිවෙලට වෙනත් අයදුම්කරුවකු කැඳවනු ලබන අතර නොපැමිණි අයදුම්කරුවන් පිළිබඳ නැවත සලකා බලනු නොලැබේ. එසේම කිසිදු හේතුවක් මත ඔබ විසින් අයදුම්කර ඇති පාඨමාලාව හා ඉල්ලා ඇති මාධ්‍යය වෙනස් කරනු නොලැබේ.

10. සම්මුඛ පරීක්ෂණය දිනයේදී ඒ සඳහා ඉදිරිපත්වීමට පෙර මෙම කැඳවීම් ලිපියේ දක්වා ඇති පරිදි අදාළ අංකය සහිත මැතිවරණ උද්ධෘත පරීක්ෂා කිරීමේ මණ්ඩලය වෙත ඡන්දහිමි නාමලේඛනවල දත්ත පරීක්ෂාව සඳහා යොමු වීම අනිවාර්ය වේ.

11. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳ වූ පමණින් ඔබ කිසියම් පාඨමාලාවකට තෝරාගත් බව හෝ ඒ සඳහා සුදුසුකම් ලැබූ බවට කිසිසේත්ම සැලකිය යුතු නොවේ. පළමු සම්මුඛ පරීක්ෂණය අනුව සුදුසුකම් ප්‍රමාණවත් වේ නම් පමණක් දෙවන වර සුදුසුකම් පරීක්ෂා කර බැලීමට සහ ඒ අනුව අදාළ විද්‍යාපීඨයේ ලියාපදිංචිය සිදුකිරීම සඳහා ඔබට කැඳවීම් කරනු ලැබේ. කෙසේ නමුත් ඉහත සඳහන් කවර හෝ ලේඛනයක් ගැසට් නිවේදනය ප්‍රකාරව කූඨ හෝ වංචනික හෝ බව පසුව හෙළිවුවහොත් ඔබ පුහුණුවෙන් / සේවයෙන් පහකරනු ලබන අතර රාජ්‍ය සේවයේ කිසිම පත්වීමක් සඳහා සුදුස්සෙකු නොවන බව ද අවධාරණය කරනු ලැබේ.


## **සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන ආයතනයට පැමිණෙන ගමන් මාර්ගය**

දක්ෂිණ අධිවේගී මාර්ගයේ කඩවත දෙස සිට පෞද්ගලික වාහනයකින් පැමිණෙන්නේ නම් ඉමදුව පිවිසුමෙන් පිටවී අකුරැස්ස නගරයට පැමිණ එහි සිට කි.මී.07 ක් අකුරැස්ස කඹුරුපිටිය මාර්ගයේ පැමිණිය යුතුය. නොඑසේ නම් ගොඩගම පිවිසුමෙන් පිටවී අකුරැස්ස නගරයට පැමිණ එහි සිට කි.මී.07 ක් අකුරැස්ස කඹුරුපිටිය මාර්ගයේ පැමිණිය යුතුය.

මත්තල දෙස සිට අධිවේගී මාර්ගයෙන් පැමිණෙන්නේ නම් ගොඩගම පිවිසුමෙන් පිටවී අකුරැස්ස නගරයට පැමිණ එහි සිට කි.මී.07 ක් අකුරැස්ස කඹුරුපිටිය මාර්ගයේ පැමිණිය යුතුය. නොඑසේ නම් අපරැක්ක පිවිසුමෙන් පිටවී යටියන හරහා කිරින්ද හංදියෙන් හක්මන - අකුරැස්ස මාර්ගයේ කි.මී.16 ක් පැමිණිය යුතුය.

පොදු ප්‍රවාහන සේවා භාවිත කරන්නේ නම් මාතර නගරයට පැමිණ එහි සිට මාතර - කඹුරුපිටිය බස්රථයක කඹුරුපිටිය නගරයට පැමිණ එහි සිට හක්මන - අකුරැස්ස බසයක ( අකුරැස්ස දෙසට ) කි.මී.07 ක් පැමිණිය යුතුය.

( ඔබගේ පහසුව සඳහා Google Map භාවිත කිරීම වඩාත් උචිත වේ.)



මෙම පෝරමය පුරවා මැතිවරණ උද්ඝෘත පරීක්ෂා කිරීමේ මණ්ඩලය වෙත ලබාදිය යුතුය.

# ඡන්ද හිමි නාමලේඛන තොරතුරු

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..................................................................................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................................................................................................

3. මවගේ සම්පූර්ණ නම : ..................................................................................................................................

4. ජාතික හැඳුම්පත් අංකය : ..................................................................................................................................

5. පියාගේ සම්පූර්ණ නම : ..................................................................................................................................

6. ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................................................................................................

7. මැතිවරණ දිස්ත්‍රික්කය : ..................................................................................................................................

( Electoral District )

8. මැතිවරණ කොට්ඨාශය : ..................................................................................................................................

( Polling Division )

9. ගම සහ වීදිය : ..................................................................................................................................

( Village and Street )

10.ග්‍රාම නිලධාරී කොට්ඨාශ අංකය: ..................................................................................................................................

( Grama Niladhari Division No/G.ND.No.)

11. ග්‍රාම නිලධාරී වසම : ..................................................................................................................................

( Grama Niladhari Division )

12. ඡන්ද කොට්ඨාශ අංකය : ..................................................................................................................................

( Polling Division No )

**2021/2022 අ.පො.ස (උ/පෙළ) විභාග ප්‍රතිඵල මත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට බඳවා ගැනීම - 2023(2024)**

## පරිගණකගත දත්ත ඇසුරින් මැතිවරණ උද්ධෘත පරීක්ෂා කිරීමේ තොරතුරු පත්‍රිකාව

(1) ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ නම - නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය

(2) අයදුම්කරුගේ සම්පූර්ණ නම - ..........................................................................................................................

(3) විද්‍යාපීඨ ප්‍රවේශය සඳහා ඉල්ලුම් කරනු ලබන අ.පො.ස.(උ.පෙළ) ප්‍රතිඵල අයත් වර්ෂය : ..........................................

(4) පාඨමාලාව :............................................ මාධ්‍යය :..........................................

(5) ජාතික හැඳුනුම්පත් අංකය :.........................................................................................

(6) පළමු වරට අ.පො.ස.(උ.පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය :.......................................

- **ස්ථිර පදිංචිය නිර්ණය කිරීම**

**2024.03.15 ගැසට් නිවේදනයේ 6.2 අනුව අයදුම්කරු පළමු වරට අ.පො.ස.(උ.පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය හා ඊට පූර්වාසන්න වර්ෂ දෙකට අදාළව සම්පූර්ණ කළයුතු තොරතුරු**

(7) i. අදාළ කාලසීමාව තුළ අයදුම්කරු ස්ථිර පදිංචිව සිට ඇත්තේ දෙමාපියන් යටතේද? නොඑසේ නම් භාරකරුවකු යටතේද? .......................................................................

ii. ඒ සම්බන්ධයෙන් විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණක් වෙතොත් එය කෙටියෙන් සඳහන් කරන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

iii. උක්ත පදිංචිය පැවතියේ දෙමාපියන් යටතේ නම්, ඔවුන්ගේ නම්

මව ..........................................................................................................................................

පියා ..........................................................................................................................................

iv. එම පදිංචිය පැවතියේ භාරකරුවකු යටතේ නම්, ඔහුගේ හෝ ඇයගේ නම

.............................................................................................................................................

(8) ගැසට් නිවේදනය ප්‍රකාරව ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය: [ ]

(9) ගැසට් නිවේදනය ප්‍රකාරව ස්ථිර පදිංචි පළාත: .........................................................

(10) ඡන්ද හිමි නාමලේඛනයේ අදාළ දිස්ත්‍රික්කයෙන් ඡන්දය සඳහා ලියාපදිංචි වී ඇති බව සනාථ කිරීම

| සලකා බලනු ලබන වර්ෂ තුන | | | |
|---|---|---|---|
| අයදුම්කරුගේ නම ඡන්ද හිමි නාමලේඛනයේ ඇතුළත් වී තිබේද? ( ඔව් √ / නැත -X) | | | |
| අයදුම්කරුගේ නම ඇතුළත්ව නොමැති වසරවල දෙමාපියන්ගේ /භාරකරුගේ නම ඡන්ද හිමි නාමලේඛනයේ ඇතුළත් වී තිබේද? ( ඔව් √ / නැත -X) | | | |

(11) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අවධානය යොමු කළ යුතු විශේෂ කරුණු කෙටියෙන්

.............................................................................................................................................

.............................................................................................................................................

මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අදාළ වර්ෂවල ඡන්ද හිමි නාමලේඛන දත්ත අන්තර් ජාලය/මෘදු පිටපත් ඔස්සේ පරීක්ෂා කරන ලද අතර, ඒ අනුව ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමු.

**මැතිවරණ උද්ධෘත පරීක්ෂා කිරීමේ මණ්ඩලය**

| සභාපති | සාමාජික 1 (අධ්‍යයන ) | සාමාජික 11 ( අනධ්‍යයන ) | සාමාජික 111 ( අනධ්‍යයන ) |
|---|---|---|---|
| ........................ | ........................ | ........................ | ...................... |
| නම- | නම- | නම- | නම- |
| තනතුර- | තනතුර- | තනතුර- | තනතුර- |
| නිල මුද්‍රාව | | | |

**2021/2022 අ.පො.ස (උ/පෙළ) විභාග ප්‍රතිඵල මත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට බඳවා ගැනීම - 2023(2024)**

## සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සඳහා ඉදිරිපත් කරනු ලබන පෝරමය

## නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය

- අයදුම්කරුගේ සම්පූර්ණ නම:....................................................................................................................................

**අ- කොටස**

| | |
|---|---|
| මැතිවරණ උද්ධෘත පරීක්ෂා කිරීමේ මණ්ඩල අංකය | |
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩල අංකය | |
| අයදුම්පත් අංකය | |
| සම්මුඛ පරීක්ෂණ දිනය | |
| පාඨමාලාව | |
| මාධ්‍යය | |
| අ.පො.ස. (උ.පෙළ) වර්ෂය | |
| Z අගය | |
| දිස්ත්‍රික්කය | |

**ආ - කොටස**

ඉදිරිපත් කරනු ලබන සහතික පිළිබඳ තොරතුරු ( √ ලකුණ යොදන්න. )

| අනු අංකය | සහතිකය/ ප්‍රකාශය | මුල් පිටපත | | ජායා පිටපත | |
|---|---|---|---|---|---|
| | | ඇත | නැත | ඇත | නැත |
| 1 | සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ ලිපිය | | | | |
| 2 | උප්පැන්න සහතිකය | | | | |
| 3 | ජාතික හැඳුනුම්පත | | | | |
| 4 | අ.පො.ස.(උ.පෙළ) විභාග සහතිකය (Z අගය සහිත ) | | | | |
| 5 | අ.පො.ස.(සා.පෙළ) විභාග සහතිකය | | | | |
| 6 | ශිෂ්‍ය කාර්ය දර්ශකය ( පාසල් හැරයාමේ සහතිකය ) | | | | |
| 7 | අවසන් වරට ඉගෙනුම ලැබූ විදුහලේ විදුහල්පතිතුමාගෙන් / තුමියගෙන් ලබාගත් චරිත සහතිකය | | | | |
| 8 | ග්‍රාම නිලධාරීගෙන් මාස 06 ක් ඇතුළත ලබා ගත් පදිංචිය හා චරිතය පිළිබඳ සහතිකය (DS-04) | | | | |
| 9 | දිවුරුම් ප්‍රකාශ 5 (ඇමුණුම 05හි දක්වා ඇති ) | | | | |
| 10 | ජීව දත්ත පත්‍රිකාව (ඇමුණුම 06 හි දක්වා ඇති ) | | | | |
| 11 | මාර්ගගත ක්‍රමවේදය (Online System) හරහා යොමු කරන ලද අයදුම්පතෙ හි ස්ථිර දෘඪ පිටපත (PDF) | | | | |
| 12 | නමේ වෙනසක් ඇතිනම් දිවුරුම් ප්‍රකාශය | | | | |

**ඇ - කොටස**

**සම්මුඛ පරීක්ෂණ මණ්ඩල තීරණය..**

මැතිවරණ උද්ධෘත පරීක්ෂා කිරීමේ මණ්ඩලයේ තීරණය අනුව අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය-..............................

| | |
|---|---|
| අදාළ සුදුසුකම් සපුරා ඇත | |
| තීරණය කල් තබන ලදි. | |
| තීරණය කල් තැබීමට සිදුවන්නේ නම් එයට හේතුව- | |
| ප්‍රතික්ෂේප කරන ලදි | |
| ප්‍රතික්ෂේප වූයේ නම් එයට හේතුව- | |

**සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජික**

| | නම | තනතුර | අත්සන |
|---|---|---|---|
| 1 | ....................................................................................... | ........................................ | ........................................ |
| 2 | ....................................................................................... | ........................................ | ........................................ |
| 3 | ....................................................................................... | ........................................ | ........................................ |

# 2021/2022 අ.පො.ස (උ/පෙළ) විභාග ප්‍රතිඵල මත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ශික්ෂණලාභීන් බඳවා ගැනීම - 2023(2024)

## නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය

| | |
|---|---|
| 1. මුලකුරු සමග නම | මෙය/මයා |
| 2. සම්පූර්ණ නම | |
| 3. ජාතික හැඳුනුම්පත් අංකය | |
| 4. දිස්ත්‍රික්කය | |
| 5. පාඨමාලාව සහ මාධ්‍යය | ගණිතය (සිංහල මාධ්‍යය/ඉංග්‍රීසි මාධ්‍යය) |
| 6. 2021/2022 (උ/පෙළ) **Z** අගය | |
| 7. සම්මුඛ පරීක්ෂණ දිනය | |
| 8.සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය | මණ්ඩල අංක - |
| 9. පළමු සම්මුඛ පරීක්ෂණයේ තීරණය | සුදුසුකම් සම්පූර්ණ කර ඇත (Q)<br>ප්‍රතික්ෂේප කරන ලදී (R)<br>තීරණය පසුවට කල් තබන ලදී (P) |
| 10.බඳවා ගැනීමට අදාළ පදනම | දිස්ත්‍රික්ක/ පළාත්/ ජාතික |
| විශේෂ සටහන් | |

| | |
|---|---|
| තේරී පත් වූ විද්‍යාපීඨය - | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය |

# දිවුරුම් ප්‍රකාශ

## දිවුරුම් ප්‍රකාශය 01

..........................................................................................................................................................පදිංචි

.......................................................................................................................... වන මම 2024.03.15 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනයේ 8.6 හි සඳහන් වගන්තියට අනුව විද්‍යාපීඨ ප්‍රවේශය සඳහා අයදුම් කරන විට / සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින විට විවාහය ලියාපදිංචි කර නොමැති බවටත් දික්කසාද වී නොමැති බවටත් සහතික කරමි. එමෙන්ම පාඨමාලාව හදාරන කාලය තුළ විවාහක බව අනාවරණය වුවහොත් මා පාඨමාලාවෙන් ඉවත් කිරීමට යටත් වන බවටත් බෞද්ධ/ ක්‍රිස්තියානි / හින්දු / ඉස්ලාම් ආගමිකයෙකු වශයෙන් ගෞරව බහුමානයෙන් යුතුව සත්‍යවාදී ලෙස මම අවංකව ප්‍රකාශ කර සිටිමි.

දිනය ....................................  අයදුම්කරුගේ අත්සන ...............................................

මා ඉදිරිපිට දී අත්සන් කරන ලදි.

දිනය -......................................................  සාමදාන විනිශ්චයකාර අත්සන - .....................................................
**( මුළු දිවයිනටම )**
නම සහ නිල මුද්‍රාව

---

## දිවුරුම් ප්‍රකාශය 02

..........................................................................................................................................................පදිංචි

.......................................................................................................................... වන මම 2024.03.15 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනයේ 8.6 හි සඳහන් වගන්තියට අනුව රජයේ හෝ රජයේ ආධාර ලබා උපකෘත පාසල්වල, රජයේ ලියාපදිංචි පිරිවෙන්වල හෝ අනුමත වෙනත් විද්‍යායතනවල ගුරුපත්වීමක් ලබා නොමැති බව හෝ තෝරාගෙන නොමැති බවට බෞද්ධ/ ක්‍රිස්තියානි / හින්දු / ඉස්ලාම් ආගමිකයෙකු වශයෙන් ගෞරව බහුමානයෙන් යුතුව සත්‍යවාදී ලෙස මම අවංකව ප්‍රකාශ කර සිටිමි.

දිනය ....................................  අයදුම්කරුගේ අත්සන ...............................................

මා ඉදිරිපිට දී අත්සන් කරන ලදි.

දිනය .....................................  සාමදාන විනිශ්චයකාර අත්සන.......................................
**( මුළු දිවයිනටම )**
නම සහ නිල මුද්‍රාව

---

## දිවුරුම් ප්‍රකාශය 03

..........................................................................................................................................................පදිංචි

.......................................................................................................................... වන මම 2024.03.15 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනයේ 8.5 හි සඳහන් වගන්තියට අනුව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක පාඨමාලාවක් හදාරමින් සිට හැර ගොස් නොමැති බව, හදාරමින් නොසිටින බව, හදාරා අවසන් කර ඇති බව, විනයානුකූල හේතූන් මත හෝ වෙනත් හේතූන් මත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයකින් ශිෂ්‍යභාවය අවලංගු කර නොමැති බවට බෞද්ධ/ ක්‍රිස්තියානි / හින්දු / ඉස්ලාම් ආගමිකයෙකු වශයෙන් ගෞරව බහුමානයෙන් යුතුව සත්‍යවාදී ලෙස මම අවංකව ප්‍රකාශ කර සිටිමි.

දිනය ....................................  අයදුම්කරුගේ අත්සන ...............................................

මා ඉදිරිපිට දී අත්සන් කරන ලදි.

දිනය .....................................  සාමදාන විනිශ්චයකාර අත්සන.......................................
**( මුළු දිවයිනටම )**
නම සහ නිල මුද්‍රාව

**දිවුරුම් ප්‍රකාශය 04**

..................................................................................................................................................................................................පදිංචි

....................................................................................................................................................... වන මම 2024.03.15 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනයේ 8.4 හි සඳහන් වගන්තියට අනුව රජයේ විශ්වවිද්‍යාලයක / රජයේ විශ්වවිද්‍යාල විද්‍යායතනයක අ.පො.ස.(උ.පෙළ) සුදුසුකම් වලින් බඳවා ගනු ලබන උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා "රජයේ නිදහස් අධ්‍යාපන වරප්‍රසාද" යටතේ අභ්‍යන්තර ශිෂ්‍යයකු ලෙස ලියාපදිංචි වී නොමැති බවත්, එවැනි පාඨමාලාවක් හදාරමින් නොසිටින බවත්, එවැනි උපාධි පාඨමාලාවක් හදාරා අවසන් කර නොමැති බවත්, අදාළ පාඨමාලාවක ලියාපදිංචි වී සිට ගැසට් නිවේදනය පළවීමෙන් පසුව ලියාපදිංචිය අවලංගු කරගෙන හෝ ගැසට් නිවේදනය පළවීමෙන් පසුව / සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමෙන් පසුව ඉහත ආයතනයක අදාළ පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී පසුව එය අවලංගු කරගෙන නොමැති බවත් බෞද්ධ/ ක්‍රිස්තියානි / හින්දු / ඉස්ලාම් ආගමිකයෙකු වශයෙන් ගෞරව බහුමානයෙන් යුතුව සත්‍යවාදී ලෙස මම අවංකව ප්‍රකාශ කර සිටිමි.

දිනය .................................... අයදුම්කරුගේ අත්සන .......................................................

මා ඉදිරිපිට දී අත්සන් කරන ලදි.

දිනය .................................... සාමදාන විනිශ්චයකාර අත්සන.......................................

**( මුළු දිවයිනටම )**

නම සහ නිල මුද්‍රාව

**දිවුරුම් ප්‍රකාශය 05**

..................................................................................................................................................................................................පදිංචි

....................................................................................................................................................... වන මම 2024.03.15 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනයේ 9.16 හි සඳහන් වගන්තියට අනුව දිස්ත්‍රික්ක/පළාත්/ජාතික පදනමින් බඳවා ගත්තද, ස්ථාන ගත කිරීමේදී අදාළ දි දිස්ත්‍රික්කයේ /අදාළ පළාතේ පුරප්පාඩු නොමැති නම් රාජ්‍ය සේවා කොමිසමේ අධ්‍යාපන සේවා කමිටුවේ අනුමැතියට යටත්ව අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලය/ අධ්‍යාපන ලේකම් බලතල ප්‍රකාරව දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට බැඳී සිටින බවත් බෞද්ධ/ ක්‍රිස්තියානි / හින්දු / ඉස්ලාම් ආගමිකයෙකු වශයෙන් ගෞරව බහුමානයෙන් යුතුව සත්‍යවාදී ලෙස මම අවංකව ප්‍රකාශ කර සිටිමි.

දිනය .................................... අයදුම්කරුගේ අත්සන ...............................................

මා ඉදිරිපිට දී අත්සන් කරන ලදි.

දිනය .................................... සාමදාන විනිශ්චයකාර අත්සන.......................................

**( මුළු දිවයිනටම )**

නම සහ නිල මුද්‍රාව

**2021/2022 අ.පො.ස.(උ.පෙළ) ප්‍රතිඵල මත ගුරු ශික්ෂණලාභීන් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත් කර ගැනීම - 2023(2024)**

**ජීව දත්ත ප්‍රකාශය**.

අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතුය.

01. අයදුම්කර ඇති පාඨමාලා **(අයදුම් කරන අවස්ථාවේ දක්වන ලද කැමැත්ත අනුපිළිවෙලට** )

පාඨමාලාවේ නම | මාධ්‍යය

i. ............................................................. ....................................

ii. ............................................................ ...................................

iii............................................................ ....................................

02. (i) සම්පූර්ණ නම ( සිංහලෙන් ) ..................................................................................................................................................

(ii) සම්පූර්ණ නම ( ඉංග්‍රීසියෙන්) ........................................................................................................................................

(iii) (අ) මුලකුරු සමඟ නම ( සිංහලෙන්) ......................................................................................... හිමි/මයා/මෙනවිය

(ආ) මුලකුරු සමඟ නම ( ඉංග්‍රීසියෙන්) ......................................................................................................Rev/Mr/Miss

03. ස්ත්‍රී/පුරුෂ භාවය : ........................................................ 04. ආගම ...............................................................

04. i. ස්ථිර පදිංචි ලිපිනය (අ) ඉංග්‍රීසියෙන් :

..................................................................................................................................................................................................

(ආ) සිංහලෙන්:

..................................................................................................................................................................................................

ii. තැපැල් කාර්යාලයේ සංකේත අංකය: ................................................

iii. දුරකථන අංක : ජංගම ................................................................. ස්ථාවර .........................................................................

iv. ස්ථිර පදිංචි පරිපාලන දිස්ත්‍රික්කය : ............................ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය: ........................................

v. පළාත: ............................................... ග්‍රාම නිලධාරී වසම : ......................................................................................

05. ජාතික හැඳුනුම්පත් අංකය: ....................................................................................

06. i. උපන් දිනය : වර්ෂය : ............................මාසය ....................................... දිනය................................

ii. 2023.01.01 දිනට වයස අවුරුදු : ................................. මාස .............................. දින ......................

07. ජන වර්ගය : සිංහල/ ශ්‍රී ලාංකික ද්‍රවිඩ/ ඉන්දියානු ද්‍රවිඩ / මුස්ලිම්/ වෙනත්

08. 2024 වර්ෂයේ අධ්‍යාපන විද්‍යාපීඨයට ඇතුළත්වීම වෙනුවෙන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීම් ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල :

i. වර්ෂය : .................................................................

ii.විභාග අංකය :.....................................................

iii.ලැබූ සාමාන්‍ය z අගය :....................................

iv.ප්‍රතිඵල විස්තරය

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. ...................................................................... | ....................... |
| 2. .................................................................... | ....................... |
| 3. .................................................................... | ....................... |
| 4. ...................................................................... | ....................... |

09. i. ඔබ ඉහත අංක 09 යටතේ සඳහන් කළ අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටි පරිපාලන දිස්ත්‍රික්කය - ..................................................

ii. අයදුම්පත් කැඳවීමට අදාළ 2024.03.15 දිනැති ගැසට් නිවේදනයේ **6.2** ඡේදය යටතේ සඳහන් දිස්ත්‍රික්කය නිර්ණය කිරීමේ නිර්නායක අනුව ඔබ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ප්‍රවේශය සඳහා සලකා බැලිය යුතු දිස්ත්‍රික්කය - ..........................................................

10. ඔබ ඉහත අංක 09 යටතේ සඳහන් කළ වර්ෂයට **<u>පෙර</u>** අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටියේ නම්, ඔබ පෙනී සිටියේ එක් විෂයයකට පමණක් වුව ද සම්පූර්ණ විස්තර සඳහන් කරන්න.

| වර්ෂය | විභාග අංකය | විෂයය | ලැබූ ශ්‍රේණිය | Z අගය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

11. ඔබ ඉහත අංක 09 යටතේ සඳහන් කළ වර්ෂයට **<u>පසු</u>** අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිට ඇත්නම්, ඔබ පෙනී සිටියේ එක් විෂයයකට පමණක් වුව ද සම්පූර්ණ විස්තර සඳහන් කරන්න.

| වර්ෂය | විභාග අංකය | විෂයය | ලැබූ ශ්‍රේණිය | Z අගය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

12. සමත් වූ අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර:

| | | | |
|---|---|---|---|
| i. වාරය : | 1 | 2 | 3 |
| ii.වර්ෂය: | ........................... | .............................. | ............................... |
| iii.විභාග අංකය | ............................ | ................................ | .............................. |
| iv.විෂය හා ශ්‍රේණිය | ......................... | .............................. | ............................. |

| **විෂය අංකය හා විෂයය** | **1 වාරය** | **2 වාරය** | **3 වාරය** |
|---|---|---|---|
| | **ශ්‍රේණිය** | **ශ්‍රේණිය** | **ශ්‍රේණිය** |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

13. චරිත සහතික ලබාගත් අයගේ

නම | තනතුර

1. ................................................................................................................................ ....................................
2. ................................................................................................................................ ....................................

14. ඔබ ශ්‍රී ලංකාවේ යම් විශ්වවිද්‍යාලයක / රජයේ විශ්වවිද්‍යාල විද්‍යායතනයක අ.පො.ස.(උ.පෙළ) සුදුසුකම් වලින් බඳවා ගනු ලබන උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා "රජයේ නිදහස් අධ්‍යාපන වරප්‍රසාද" යටතේ <u>අභ්‍යන්තර ශිෂ්‍යයකු ලෙස ලියාපදිංචි වී</u>, එවැනි පාඨමාලාවක් හදාරමින් සිටින හෝ එවැනි උපාධි පාඨමාලාවක් හදාරා අවසන් කර අවසන් කළ අයෙක්ද? .......................................................... ( ඔව්/ නැත)

14. i එසේ ලියාපදිංචි වී ඇත්නම් ඒ පිළිබඳ තොරතුරු

..............................................................................................................................................

..............................................................................................................................................

15. ඔබ ඉගෙනුම ලැබූ එක් එක් පාසල පිළිබඳ විස්තර පහත දක්වන්න.

| පාසලේ නම | ඉගෙනුම ලැබූ කාලය | | | | | |
|---|---|---|---|---|---|---|
| | සිට | | | දක්වා | | |
| | අවු | මාස | දින | අවු | මාස | දින |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

16. අයදුම්කරුගේ ප්‍රකාශය :

(i) මා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයකට ඇතුළත්වීම සඳහා ඉහත ජීව දත්ත පෝරමයේ අංක 09 යටතේ සඳහන් කළ වර්ෂය හෝ ඊට පෙර හෝ පසුව පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයක ප්‍රතිඵල මත ශ්‍රී ලංකාවේ යම් විශ්වවිද්‍යාලයක / රජයේ විශ්වවිද්‍යාල විද්‍යායතනයක අ.පො.ස.(උ.පෙළ) සුදුසුකම් වලින් බඳවා ගනු ලබන උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා "රජයේ නිදහස් අධ්‍යාපන වරප්‍රසාද" යටතේ අභ්‍යන්තර ශිෂ්‍යයකු ලෙස ලියාපදිංචි වී, එවැනි පාඨමාලාවක් හදාරමින් සිටින හෝ එවැනි උපාධි පාඨමාලාවක් අවසන් කළ අයෙක් නොවන බවත්,

(ii) දැනට මා අවිවාහක බවත්, පාඨමාලාව හදාරණ කාලය තුළ විවාහ නොවන බවත්,

(iii) මා දැනට රජයේ හෝ රජයට අනුබද්ධ පෞද්ගලික පාසලක ගුරු පත්වීමක් ලබා නැති බවත්, රජයේ පාසලක පත්වීමක් සඳහා තෝරාගනු ලැබූ අයෙකු නොවන බවත්,

(iv) මා විසින් අයදුම්පතේ සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඒ තොරතුරු අසත්‍ය හෝ වැරදි බව හෙළි වුවහොත් මා තෝරා ගැනීමට නුසුදුස්සෙකු වන බවත්, තෝරා ගැනීමෙන් පසුව අසත්‍ය හෝ වැරදි බව හෙළි වුවහොත් මාගේ තෝරා ගැනීම අවලංගු වන බව දන්නා බවත්, මම මෙයින් සහතික කර ප්‍රකාශ කර සිටිමි.

(v) පාඨමාලාවට තෝරා ගතහොත් එම පාඨමාලාව සාර්ථකව නිම කිරීමෙන් පසුව දුෂ්කර දිස්ත්‍රික්කවල ඇති වන ඇබෑර්තු පදනම් කර ගෙන ලබාදෙන පත්වීම අනුව වුවද සේවය කිරීමට එකඟවන බවත් ප්‍රකාශ කරමි.

දිනය :....................................        අයදුම්කරුගේ අත්සන ....................................................


මා ඉදිරිපිට දී අත්සන් කරන ලදි.

දිනය :....................................        සාමදාන විනිශ්චයකාර අත්සන ........................................

**( මුළු දිවයිනටම)**

නම සහ නිළ මුද්‍රාව.

ඔබ සම්මුඛ පරීක්ෂණයට පැමිණීම ප්‍රතික්ෂේප කරන්නේ නම් පහත පත්‍රිකාව සම්පූර්ණ කර එහි ඡායාරූපයක් pnniwa@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කිරීමට සහ පහත ලිපිනයට තැපැල් මගින් එවීමට කටයුතු කරන්න. සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන දින සිට සතියක කාලය තුළ ඔබගේ පැමිණීම සනාථ නොකරන්නේ නම් ඔබ මෙම සම්මුඛ පරීක්ෂණයට නොපැමිණෙන සේ සලකා කටයුතු කිරීමට සිදුවන බවද වැඩිදුරටත් දන්වා සිටිමි.




වී.පී.ආර්.ගුණවර්ධන,

පීඨාධිපති

නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය

දුරකථන අංක - 041 – 2283214, 077-9824300, 071-8034352.

ලිපිනය - නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය ,විල්පිට , අකුරැස්ස.

-----------------------------------------------------------------------------------------------------------

**මුලකුරු සමඟ නම :..............................................................................................................**

**ලිපිනය : ..........................................................................................................................**

**ජාතික හැඳුනම්පත් අංකය : ...............................................................**

**තේරී පත් වී ඇති පාඨමාලාව : ....................................... මාධ්‍යය : ..................................**

**දිස්ත්‍රික්කය : ............................... z අගය - ................ අ.පො.ස(උ/පෙළ)වර්ෂය-...................**

**සම්මුඛ පරීක්ෂණයට පැමිණීම ප්‍රතික්ෂේප කිරීමට හේතුව:**

**.......................................................................................................................................**

**.......................................................................................................................................**

**.......................................................................................................................................**

**..........................** **..................**

**දිනය** **අත්සන**